අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

තාක්ෂණවේදය සඳහා විද්‍යාව

විෂය නිර්දේශය

12, 13 ශ්‍රේණි

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව.

www.nie.lk

හැඳින්වීම

මෙම විෂය නිර්දේශය තාක්ෂණවේදය විෂය ධාරාව හදාරන දරු දැරියන්ට ඔවුන්ගේ තාක්ෂණික විෂයය වන ඉංජිනේරු තාක්ෂණවේදය හෝ ජෛවපද්ධති තාක්ෂණවේදය විෂයය හැදෑරීමේ දී අවශ්‍ය වන ගණිතය, විද්‍යාව හා තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික අවබෝධය ලබා දීමේ අරමුණින් සකස් කර ඇත. ඊට අමතර ව මෙම විෂයය හැදෑරීමෙන් කාර්මික ක්ෂේත්‍රයේ රැකියාවලට යොමු වන දරු දැරියන්ට ඒ සඳහා අවශ්‍ය මූලධර්ම හා සංකල්ප පිළිබඳ අවබෝධයක් ලබා දෙයි. එමෙන් ම මෙම විෂය නිර්දේශය මගින් කාර්මීකරණය නිසා දැනට උද්ගත ව ඇති ගැටලුමය තත්ත්වයන් සහ අනාගතයේ දී ඇති විය හැකි අර්බුද පිළිබඳ සංවේදී භාවයෙන් යුතු ව ඒවාට විසඳුම් සොයා ගැනීමට පෙලඹවීමක් ඇති කරයි.

ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය හා තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍ර පිළිබඳ ව වන නිපුණතා හා නිපුණතා මට්ටම් කිහිපයක් ඔස්සේ දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය වන ආකාරයට උචිත ක්‍රියාකාරකම් ඇතුළත් කොට සැලසුම් කර ඇත. එබැවින් මෙහි ඇතුළත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපායයන් පන්ති කාමරය තුළ දී, විද්‍යාගාරයේ දී හෝ අවස්ථා සපයා ගත හැකි වෙනත් සුදුසු ස්ථානයන්හි දී ප්‍රායෝගික ව අත්හදා බැලීම අත්‍යවශ්‍ය වේ. එවිට ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුළින් අත්පත් කර ගන්නා නිපුණතා එදිනෙදා ජීවිතයේ දී ඵලදායී ලෙස උපයෝගී කර ගනිමින් අභියෝග ජය ගැනීමට හැකි වනු ඇත. මෙම විෂයය ඉගැන්වීමේ දී ගුරුවරයාගේ නිර්මාණාත්මක හැකියා උපයෝගී කර ගනිමින් සාර්ථක ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ගැනීම වැදගත් වේ.

2.0 ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III. මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

3.0 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2003 දෙසැම්බර්)

විෂය අරමුණු

(1) තාක්ෂණික ක්ෂේත්‍රයේ මතු වන ගැටලු විසඳීම සඳහා විද්‍යාත්මක සංකල්ප යොදා ගැනීම.

(2) තොරතුරු තාක්ෂණය පිළිබඳ ව ගැඹුරු දැනුමක් ලබා ගැනීමට උනන්දුවක් ඇති කර ගැනීම.

(3) එදිනෙදා ජීවිතය සඳහා වැදගත් මූලික ගණිත සංකල්ප ප්‍රගුණ කිරීම.

(4) විද්‍යාත්මක සංකල්ප පිළිබඳ මූලික දැනුම තාක්ෂණික, සමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා භාවිත කිරීම.

(5) ජාතික හා ගෝලීය පාරිසරික ගැටලු අධ්‍යයනය කරමින් තිරසාර ලෙස සම්පත් භාවිත කළ හැකි ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම

එක් එක් නිපුණතාව සඳහා යෝජිත කාලච්ඡේද

12 ශ්‍රේණිය

නිපුණතාව	කාලච්ඡේද
1. වර්ගඵලය හා පරිමාව පිළිබඳ විමර්ශනය කරමින් සීමිත ඉඩකඩක් ප්‍රශස්ත මට්ටමින් භාවිත කරයි.	17
2. විවිධ මිනුම් සඳහා යෝග්‍ය මිනුම් ඒකක සහ මිනුම් උපකරණ භාවිත කරයි.	12
3. පයිතගරස් සම්බන්ධතාව භාවිතයෙන් පහසුවෙන් ගැටලු විසඳයි.	06
4. සෛලීය සංවිධානයක් සහිත ජීවීන් තාක්ෂණය සඳහා උපයෝගී කර ගනියි.	50
5. බලය සහ එහි ආචරණ පිළිබඳ දැනුම එදිනෙදා ජීවිත අවශ්‍යතා සඳහා යොදා ගනියි.	42
6. කාර්යය, ශක්තිය සහ ජවය (ක්ෂමතාව) පිළිබඳ දැනුම ප්‍රායෝගික අවශ්‍යතා සඳහා උචිත ලෙස යොදා ගනියි.	14
7. එදිනෙදා ජීවිතයේ කාර්යය ත්‍රිකෝණමිතික අනුපාත භාවිතයෙන් පහසු කර ගනියි.	24
8. භ්‍රමණ චලිත පිළිබඳ දැනුම ප්‍රායෝගික අවශ්‍යතා සඳහා යොදා ගනියි.	24
9. විදුලි උපකරණ නඩත්තු කිරීම සහ පරිපථ සැලසුම් කිරීම සඳහා විද්‍යුතය පිළිබඳ දැනුම යොදා ගනියි.	27
10. තාපය පිළිබඳ දැනුම එදිනෙදා කටයුතු සහ විද්‍යාත්මක කටයුතු සඳහා යොදා ගනියි.	23
11. තාප රසායනය හා සම්බන්ධ මූලික සංකල්ප ගවේෂණය කරයි.	17
12. චාලක රසායන විද්‍යාවේ මූලික සංකල්ප භාවිතයෙන් ප්‍රතික්‍රියා ශීඝ්‍රතාව පාලනය කරයි.	20
13. කාබනික සංයෝග, ජෛවාණුවල ව්‍යුහය, වැදගත්කම හා භාවිත ගවේෂණය කරයි.	24
එකතුව	300

13 ශ්‍රේණිය

නිපුණතාව	කාලච්ඡේද
14. කර්මාන්ත ක්ෂේත්‍රයේ දී බහුඅවයවික භාවිතය පිළිබඳ ව විමර්ශනය කරයි.	17
15. පදාර්ථයේ යාන්ත්‍රික ගුණ පිළිබඳ දැනුම මානව අවශ්‍යතා සඳහා යොදා ගනියි.	12
16. නිශ්චල සහ චලිත වන තරල පිළිබඳ දැනුම එදිනෙදා ජීවිත අවශ්‍යතා සහ තාක්ෂණික කටයුතු සඳහා යොදා ගනියි.	26
17. ශ්‍රී ලංකාවේ රසායනික කර්මාන්ත පිළිබඳ ව විමසා බලයි.	35
18. ස්වභාව නිෂ්පාදනය හා ඒවායේ නිස්සාරණ විධි විමර්ශනය කරයි.	43
19. කාටිසියානු ඛණ්ඩාංක තලය ඇසුරෙන් ඒකජ ශ්‍රිතය හා වර්ගජ ශ්‍රිතය විමර්ශනය කරයි.	22
20. විස්තරාත්මක සංඛ්‍යානයේ අර්ථය විශ්ලේෂණය කරයි.	45
21. පරිගණක පද්ධතියක් සහ උපාංග ඵලදායී ලෙස භාවිත කිරීම සඳහා ගවේෂණය කරයි.	04
22. පරිගණක මෙහෙයුම් පද්ධතිය සමඟ ඵලදායී ලෙස කටයුතු කරයි.	09
23. එදිනෙදා දිවියේ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා යෙදුම් මෘදුකාංග භාවිත කරයි.	36
24. තොරතුරු ලබා ගැනීම සහ සන්නිවේදනය සඳහා ඵලදායී ලෙස අන්තර්ජාලය භාවිත කරයි.	15
25. තාක්ෂණික දියුණුව පාරිසරික සමතුලිතතාව කෙරෙහි බලපාන ආකාරය ගවේෂණය කරයි.	36
	300

12 හා 13 වන ශ්‍රේණි සඳහා එක් එක් වාරයට නියමිත නිපුණතා සහ නිපුණතා මට්ටම්

ශ්‍රේණිය	වාරය	නිපුණතා හා නිපුණතා මට්ටම්
12 ශ්‍රේණිය	පළමු වාරය	1.1 නිපුණතාවේ සිට 5.1 නිපුණතාව දක්වා
	දෙ වන වාරය	5.2 නිපුණතාවේ සිට 9.1 නිපුණතාව දක්වා
	තුන් වන වාරය	9.2 නිපුණතාවේ සිට 13.5 නිපුණතාව දක්වා
13 ශ්‍රේණිය	පළමු වාරය	14.1 නිපුණතාවේ සිට 18.1 නිපුණතාව දක්වා
	දෙ වන වාරය	18.2 නිපුණතාවේ සිට 22.2 නිපුණතාව දක්වා
	තුන් වන වාරය	23.1 නිපුණතාවේ සිට 25.6 නිපුණතාව දක්වා

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව
1. වර්ගඵලය හා පරිමාව පිළිබඳ විමර්ශනය කරමින් සීමිත ඉඩකඩක් ප්‍රශස්ත මට්ටමින් භාවිත කරයි.	1.1 ජ්‍යාමිතික හැඩතලවල වර්ගඵලය සහ ඝන වස්තුවල පෘෂ්ඨ වර්ගඵල විමර්ශනය කරයි.	• ජ්‍යාමිතික හැඩතලවල වර්ගඵලය (සමචතුරස්‍රය, සෘජුකෝණාස්‍රය, ත්‍රිකෝණය, සමාන්තරාස්‍රය, ත්‍රැපීසියම, වෘත්තය) • සංයුක්ත ජ්‍යාමිතික හැඩතලවල වර්ගඵලය • ඝන වස්තුවල පෘෂ්ඨ වර්ගඵලය (ඝනකය, ඝනකාභය, පිරමීඩය, ප්‍රිස්මය, සිලින්ඩරය, ගෝලය, කේතුව) සූත්‍ර භාවිතයෙන් • සංයුක්ත ඝන වස්තුවල පෘෂ්ඨ වර්ගඵලය	• ජ්‍යාමිතික හැඩතලවල වර්ගඵල සොයයි. • සංයුක්ත ජ්‍යාමිතික හැඩතලවල වර්ගඵල සොයයි. • සංයුක්ත ජ්‍යාමිතික හැඩතලවල වර්ගඵලය ආශ්‍රිත ගැටලු විසඳයි. • ඝන වස්තුවල පෘෂ්ඨ වර්ගඵල සොයයි. • සංයුක්ත ඝන වස්තුවල පෘෂ්ඨ වර්ගඵල සොයයි. • සංයුක්ත ඝන වස්තුවල පෘෂ්ඨ වර්ගඵල ආශ්‍රිත ගැටලු විසඳයි.	*10*
	1.2 ඝන වස්තුවල පරිමාව විමර්ශනය කරයි.	• ඝන වස්තුවල පරිමාව (ඝනකය, ඝනකාභය, පිරමීඩය, කේතුව, ප්‍රිස්මය, සිලින්ඩරය, ගෝලය සූත්‍ර භාවිතයෙන්) • සංයුක්ත ඝන වස්තුවල පරිමාව	• දෙන ලද ඝන වස්තුවල පරිමාව සොයයි. • සංයුක්ත ඝන වස්තුවල පරිමාව සොයයි. • සංයුක්ත ඝන වස්තුවල පරිමාව ආශ්‍රිත ගැටලු විසඳයි.	*07*

2. විවිධ මිනුම් සඳහා යෝග්‍ය මිනුම් ඒකක සහ මිනුම් උපකරණ භාවිත කරයි.	2.1 විවිධ මිනුම් සඳහා යෝග්‍ය මිනුම් ඒකක සහ මිනුම් උපකරණ භාවිත කරයි.	• භෞතික රාශි සහ සම්මත ඒකක
		• සම්මත ඒකකවල උපසර්ග
		• මිනුම් උපකරණයක කුඩා ම මිනුම
		• මිනුමේ භාගික දෝෂය සහ ප්‍රතිශත දෝෂය
		• මිනුම් උපකරණයක මූලාංක වරද
		• වර්නියර මූලධර්මය
		  • වර්නියර කැලිපරය
		• ඉස්කුරුප්පු මූලධර්මය
		  • මයික්‍රොමීටර ඉස්කුරුප්පු ආමානය
		• චල අන්වීක්ෂය
		• තෙදඬු තුලාව
		• විරාම ඝටිකාව
			• විවිධ භෞතික රාශි ඒකක සමඟ හඳුන්වා දෙයි.
			• මිනුමේ ප්‍රමාණය අනුව සම්මත ඒකකයේ උපසර්ගවල අවශ්‍යතාව පෙන්වා දෙයි.
			• සපයා ඇති මිනුම් උපකරණයක මූලාංක දෝෂය සහ කුඩා ම මිනුම ප්‍රකාශ කරයි.
			• සපයා ඇති මිනුම් උපකරණයක භාගික දෝෂය සහ ප්‍රතිශත දෝෂය ගණනය කරයි.
			• ප්‍රතිශත දෝෂය සැලකිල්ලට ගෙන කුඩා මිනුම් වඩාත් නිවැරදි ව මැනීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
			• වර්නියර මූලධර්මය ඉදිරිපත් කරයි.
				12

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව
			• ව'නියර කැලිපරය භාවිතයෙන් මිනුම් ලබා ගනියි. • ඉස්කුරුප්පු මූලධර්මය ඉදිරිපත් කරයි. • මයික්‍රොමීටර් ඉස්කුරුප්පු ආමානය භාවිතයෙන් මිනුම් ලබා ගනියි. • ඉස්කුරුප්පු මූලධර්මය භාවිත වන උපකරණ නම් කරයි. • තෙදඬු තුලාව භාවිතයෙන් මිනුම් ලබා ගනියි. • විරාම ඝටිකාව භාවිතයෙන් උචිත මිනුම් ලබා ගනියි.	
3. පයිතගරස් සම්බන්ධතාව භාවිතයෙන් පහසුවෙන් ගැටලු විසඳයි.	3.1 පාද අතර සම්බන්ධතාව විමසමින් ත්‍රිකෝණයක් ඍජු කෝණික වීම හෝ නොවීම නිගමනය කරයි.	• පයිතගරස් සම්බන්ධතාව හා එහි භාවිත • පයිතගරස් සම්බන්ධතාවයේ විලෝමය හා එහි භාවිත	• පයිතගරස් සම්බන්ධතාව ප්‍රකාශ කරයි. • පයිතගරස් සම්බන්ධතාව භාවිතයෙන් ත්‍රිකෝණයක පාදවල දිග ගණනය කරයි. • ගැටලු විසඳීම සඳහා පයිතගරස් සම්බන්ධතාව භාවිත කරයි. • පයිතගරස් සම්බන්ධතාවේ විලෝමය ප්‍රකාශ කරයි. • ගැටලු විසඳීම සඳහා පයිතගරස් සම්බන්ධතාවේ විලෝමය භාවිත කරයි.	*06*

4. සෛලීය සංවිධානයක් සහිත ජීවීන් තාක්ෂණය සඳහා උපයෝගී කර ගනියි.	4.1 ජීවී සෛලවල ව්‍යූහය හා කෘත්‍ය හඳුනා ගනියි.	• ප්‍රධාන සෛලීය සංවිධාන වර්ග
		  • ප්‍රාග් න්‍යෂ්ටික සෛල
		  • සූන්‍යෂ්ටික සෛල
		• ප්‍රාග් න්‍යෂ්ටික සහ සූන්‍යෂ්ටික සෛලවල දර්ශීය ව්‍යූහ
		  • බැක්ටීරියා සෛල
		  • දිලීර සෛල
		  • ශාක සෛල
		  • සත්ව සෛල
			• ජීවීන්ගේ තැනුම් ඒකකය සෛලය බව ප්‍රකාශ කරයි.
			• ප්‍රාග් න්‍යෂ්ටික සහ සූන්‍යෂ්ටික ලෙස සෛල වර්ග දෙකක් ඇති බව හඳුනා ගනියි.
			• සෛලවල ඇති විවිධ ඉන්ද්‍රියිකා මගින් ඉටු කරන කෘත්‍යයන් ලැයිස්තු ගත කරයි.
			• මුද්‍රිත රේඛීය රූප සටහන් මගින් මූලික සෛල සංවිධාන වර්ග හඳුනා ගනියි.
				06

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව
	4.2 තාක්ෂණික නිෂ්පාදනවල දී වැදගත් වන ක්ෂුද්‍රජීවීන් සතු ලක්ෂණ විමර්ශනය කරයි.	• ක්ෂුද්‍රජීවීන් හැඳින්වීම • ක්ෂුද්‍රජීවීන්ගේ ව්‍යාප්තිය • ක්ෂුද්‍රජීවීන්ගේ විවිධ ශ්වසන ක්‍රම • ස්වායු • වෛකල්පිත නිර්වායු • අනිවාර්ය නිර්වායු • ක්ෂුද්‍රවාතකාමී • ක්ෂුද්‍රජීවීන්ගේ විවිධ පෝෂණ ක්‍රම • ප්‍රකාශ ස්වයංපෝෂී • ප්‍රකාශ විෂමපෝෂී • රසායනික ස්වයංපෝෂී • රසායනික විෂමපෝෂී	• ක්ෂුද්‍රජීවීන් හඳුන්වයි. • ක්ෂුද්‍රජීවීන්ගේ සර්ව ව්‍යාප්තිය පිළිබඳ සාකච්ඡා කරයි. • ක්ෂුද්‍රජීවීන්ට අධික පරිවෘත්තීය වේගයක් හා ප්‍රජනන හැකියාවක් ඇති බව ප්‍රකාශකරයි. • පුළුල් කායික විවිධත්වයකින් යුක්ත නිසා විවිධ පරිසර තත්ත්වවලට අනුගත විය හැකි බව විස්තර කරයි. • ක්ෂුද්‍රජීවීන්ගේ විවිධ ශ්වසන ක්‍රම සාකච්ඡා කරයි. • ක්ෂුද්‍රජීවීන්ගේ විවිධ පෝෂණ ක්‍රම විස්තර කරයි.	*06*
	4.3 ක්ෂුද්‍ර ජීවීන් තාක්ෂණික නිෂ්පාදන සඳහා උපයෝගී කර ගැනීමේ කුසලතා ප්‍රගුණ කරයි.	• ක්ෂුද්‍රජීවීන්ගේ භාවිත • යෝගට් නිෂ්පාදනය • දියර කිරි මිදවීම • මද්‍යසාර නිෂ්පාදනය (රා, බියර්, වයින්) • ආහාර නිෂ්පාදන • බේකරි කර්මාන්තය • ප්‍රතිජීවක • රසකාරක • විනාකිරි නිෂ්පාදනය • ඇමයිනෝ අම්ල නිෂ්පාදනය • කොම්පෝස්ට් • ජෛව ප්‍රතිකර්මණය • ජීව වායුව	• ක්ෂුද්‍රජීවීන්ගේ පාරිසරික සම්බන්ධතා නිරීක්ෂණය කරයි. • විවිධ ක්ෂේත්‍රවල ක්ෂුද්‍රජීවීන්ගේ භාවිත කෙටියෙන් විස්තර කරයි. • ක්ෂුද්‍රජීවීන් භාවිත කර කරනු ලබන කර්මාන්ත නිරීක්ෂණය කොට වාර්තාවක් සකස් කරයි. • ක්ෂුද්‍රජීවී නිෂ්පාදන ලාභදායී බව සාකච්ඡා කරයි. • ශක්ති සම්පත්වල තිරසාර භාවිතය සඳහා ක්ෂුද්‍ර ජීවීන්ගේ වැදගත්කම විස්තර කරයි.	*10*

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව
	4.4 ශාකයේ කඳ , පත්‍ර හා මුල්වල ව්‍යුහය, කෘත්‍ය සහ ආර්ථික වටිනාකම හඳුනා ගනියි.	• ශාක පත්‍ර • ද්විබීජ පත්‍රී පත්‍ර • ඒකබීජ පත්‍රී පත්‍ර • ප්‍රභාසංශ්ලේෂණය • ශාක කඳ • ද්විබීජ පත්‍රී සහ ඒකබීජ පත්‍රී කඳක දළ ව්‍යුහය • ද්විබීජ පත්‍රී 3 ශාක කඳක ද්විතීයික වර්ධනය • ඒක බීජ පත්‍රී ශාක කඳක(පාමේ කුලය) අසාමාන්‍ය වර්ධනය • අරටුව හා එලය • ශාක කඳෙහි ආර්ථික වැදගත්කම • ශාක මුල • ශාක මුලෙහි ආර්ථික වැදගත්කම	• ද්විබීජ පත්‍රී සහ ඒකබීජ පත්‍රී පත්‍රවල ව්‍යුහමය වෙනස්කම් සටහන් කරයි. • ශාක පත්‍රය ප්‍රභාසංශ්ලේෂණය මගින් කාබෝහයිඩ්‍රේට නිපදවන මූලික ස්ථානය බව ප්‍රකාශ කරයි. • ශාක පත්‍රවල ආර්ථික වටිනාකම් ලැයිස්තු ගත කරයි. • ආර්ථික ව වැදගත් වීමට ශාක පත්‍ර සතු සුවිශේෂී ලක්ෂණ සාකච්ඡා කරයි. • ද්වි බීජ පත්‍රි කඳක සහ ඒක බීජ පත්‍රි කඳක ව්‍යුහයේ වෙනස්කම් සටහන් කරයි. • ද්වි බීජ පත්‍රි ශාක කඳක ද්වීතීයික වර්ධනය සහ ඒක බීජ පත්‍රි ශාක කඳක (පාමේ කුලය) අසාමාන්‍ය වර්ධනය(Anomalous growth) නිසා කඳ විෂ්කම්භයෙන් වැඩි වන බව බව අවධාරණය කරයි • ශාක කඳෙහි ආර්ථික වැදගත්කම ලැයිස්තු ගත කරයි. • ආර්ථික ව වැදගත් වීමට ශාක කඳ සතු වියයුතු සුවිශේෂී ලක්ෂණ නිරීක්ෂණය කරයි. • ශාක මුලෙහි ආර්ථික වැදගත්කම විස්තර කරයි.	*09*
	4.5 ස්වාභාවික වනාන්තරවල ව්‍යුහය විමසමින් එහි ඇති සම්පත් කර්මාන්ත සඳහා තිරසාර ලෙස යොදා ගැනීමේ කුසලතා ප්‍රගුණ කරයි.	• ප්‍රාථමික සහ ද්විතීයික වනාන්තර • ප්‍රධාන වනාන්තර වර්ග • නිවර්තන තෙත් සදාහරිත • නිවර්තන වියළි මිශ්‍ර සදාහරිත • නිවර්තන කඳුකර වනාන්තර • කේතුධර වනාන්තර • දැව වනාන්තර • වනාන්තරවල ආර්ථික වැදගත්කම	• ප්‍රාථමික සහ ද්වීතීයික වනාන්තරවල වෙනස්කම් ලැයිස්තුගත කරයි. • ප්‍රධාන වනාන්තර වර්ග කිහිපයක මූලික ව්‍යුහමය ලක්ෂණ විස්තර කරයි. • වනාන්තරවල වැදගත්කම ප්‍රකාශ කරයි. • දැව වනාන්තර ඇති කිරීමේ වැදගත්කම සාකච්ඡා කරයි.	*06*

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව
		• වනාන්තර ආරක්ෂා කර ගැනීමේ ක්‍රම • තිරසාර භාවිතය • රක්ෂිත ඇති කිරීම • වන වගා ඇති කිරීම	• වනාන්තර ආරක්ෂා කර ගැනීමේ ක්‍රමෝපායයන් පිළිබඳ වාර්තාවක් සකස් කරයි.	
	4.6 ශාක ප්‍රචාරණය කිරීමේ කාර්යක්ෂම ක්‍රමයක් ලෙස පටක රෝපණය හඳුනා ගනියි.	• පටක රෝපණය හැඳින්වීම • පටක රෝපණයට භාවිත කරන මූලික පටක වර්ග • අග්‍රස්ථ විභාජකය • ළපටි පත්‍ර කොටස් • අංකුර • ළපටි කඳන් • රේණු • පටක රෝපණයේ මූලික පියවර •පටක රෝපණයේ භාවිත	• පටක රෝපණය හඳුන්වයි. • පටක රෝපණය සඳහා යොදා ගත හැකි පටක කොටස් ලැයිස්තුගත කරයි. • පටක රෝපණයේ දී අනුගමනය කරනු ලබන මූලික පියවර විස්තර කරයි. • පටක රෝපණය භාවිතයෙන් ශ්‍රී ලංකාවේ කරනු ලබන කර්මාන්ත පිළිබඳ තොරතුරු රැස් කරයි.	*07*
	4.7 ආර්ථික වටිනාකමකින් යුත් පෘෂ්ඨවංශී හා අපෘෂ්ඨවංශී සතුන් කෙටියෙන් හඳුන්වයි.	• අපෘෂ්ඨවංශීන් • ආත්‍රොපෝඩා වංශය • ආර්ථික වැදගත්කම • ඉස්සා • මී මැස්සා • පෘෂ්ඨවංශීන් • ආර්ථික වැදගත්කම • අස්ථික මසුන් • කාටිලේජ මසුන් • පක්ෂීන් • ක්ෂීරපායින්	• අපෘෂ්ඨවංශීන් හා පෘෂ්ඨවංශීන් වෙන් කර දක්වයි. • ආත්‍රපෝඩා වංශයට අයත් ආර්ථික වටිනාකමකින් යුත් ජීවීන් නම් කරයි. • ඉස්සා හා මී මැස්සාගේ ආර්ථික වැදගත්කම සාකච්ඡා කරයි. • කෝඩේටා වංශයට අයත් ආර්ථික වටිනාකමකින් යුතු ජීවීන් නම් කරයි. • පෘෂ්ඨවංශීන් ඉහළ ආර්ථික වටිනාකමකින් යුතු බව උදාහරණ දක්වමින් (අස්ථික මසුන්, කාටිලේජ මසුන්, පක්ෂීන් හා ක්ෂීරපායින්) විස්තර කරයි.	*06*

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව
5. බලය සහ එහි ආචරණ පිළිබඳ දැනුම එදිනෙදා ජීවිත අවශ්‍යතා සඳහා යොදා ගනියි.	5.1 බලයේ ස්වභාවය සහ එහි බලපෑම් චලිතය පිළිබඳ නිව්ටන්ගේ නියම ඇසුරින් විස්තර කරයි.	• බලය • බලයේ දෛශික ස්වභාවය • බලයේ ඒකක • බල විභේදනය • ගම්‍යතාව • චලිතය පිළිබඳ නිවුටන්ගේ නියම • බර සහ ගුරුත්ව කේන්ද්‍රය • ස්වයං සීරුමාරු බල • ආතතිය • තෙරපුම • ඝර්ෂණය • ඝර්ෂණ සංගුණකය	• බලය යන්න හඳුන්වා දෙයි. • බලයකට විශාලත්වයක්, දිශාවක් හා ක්‍රියා ලක්ෂ්‍යයක් පවතින බව පෙන්වා දෙයි. • බලයක ක්‍රියා රේඛාව විස්තර කරයි. • බලයක් එකිනෙකට ලම්බක දිශා දෙකකට විභේදනය කරයි. • චලිතය ඇති කිරීම සහ චලිත ස්වභාවය වෙනස් කිරීම නිව්ටන්ගේ නියම ඇසුරින් පැහැදිලි කරයි. • ස්කන්ධයේත් ප්‍රවේගයේත් ගුණිතය ගම්‍යතාව ලෙස දක්වයි. • නිව්ටන්ගේ දෙ වන නියමය ඉදිරිපත් කරයි. • බලයේ ඒකකය වන නිව්ටනය අර්ථ දක්වයි. • $F=ma$ සමීකරණය භාවිත කර සරල ගැටලු විසඳයි. • නිව්ටන්ගේ තුන් වන නියමය ඇසුරින් ක්‍රියා ප්‍රතික්‍රියා ඇති වන ආකාරය විස්තර කරයි. • වස්තුවක බර යනු පොළොව මගින් ඇති කරන ආකර්ෂණ බලය ලෙස හඳුන්වා දෙයි. • වස්තුවක බර ක්‍රියා කරන ලක්ෂ්‍යය ගුරුත්ව කේන්ද්‍රය ලෙස නම් කරයි. • දණ්ඩක්, තැටියක් සහ වළල්ලක් යන ඒකාකාර ඝන වස්තුවල ගුරුත්ව කේන්ද්‍රය ලකුණු කර පෙන්වයි. • ස්වයං සීරුමාරු බලවල ස්වභාවය විස්තර කරයි. • සරල ක්‍රියාකාරකමක් ඇසුරින් ස්ථිතික, සීමාකාරී සහ ගතික ඝර්ෂණ බල විස්තර කරයි. • $F=\mu R$ ඉදිරිපත් කර ඝර්ෂණ සංගුණකය හඳුන්වා දෙයි. • $F=\mu R$ ආශ්‍රිත සරල ගැටලු විසඳයි.	15

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව
	5.2 බල පද්ධතියක සම්ප්‍රයුක්තය විමර්ශනය කරයි.	• ඒක රේඛීය බල දෙකක සම්ප්‍රයුක්තය • ආනත බල දෙකක සම්ප්‍රයුක්තය • බල සමාන්තරාස්‍ර ප්‍රමේයය	• ඒක රේඛීය බල දෙකක සම්ප්‍රයුක්තයේ විශාලත්වය සහ දිශාව සොයා ගනියි. • බල සමාන්තරාස්‍ර ප්‍රමේයය ඉදිරිපත් කරයි. • බල සමාන්තරාස්‍ර ප්‍රමේයයේ වීජීය ප්‍රකාශනය භාවිත කර ආනත බල දෙකක සම්ප්‍රයුක්තය සොයා ගනියි.	*09*
	5.3 බලයක භ්‍රමණ ආචරණය ප්‍රමාණනය කරයි.	• ඝූර්ණය • යුග්මයක ඝූර්ණය	• ඝූර්ණය අර්ථ දක්වයි. • ඝූර්ණය කෙරෙහි බලපාන සාධක ඉදිරිපත් කරයි. • බල යුග්මයක ඝූර්ණය විස්තර කරයි.	*07*

	5.4 ඒකතල බල පද්ධතියක සමතුලිතතාව පිළිබඳ විශ්ලේෂණය කරයි.	• ලක්ෂ්‍යාකාර වස්තුවක සමතුලිතතාව
		  • බල දෙකක් යටතේ සමතුලිතතාව
		  • බල තුනක් යටතේ සමතුලිතතාව
		• දෘඪ වස්තුවක සමතුලිතතාව
		  • බල දෙකක් යටතේ සමතුලිතතාව
		  • බල තුනක් යටතේ සමතුලිතතාව
		    • බල සමාන්තර අවස්ථාව
		    • බල ආනත අවස්ථාව
			• බල දෙකක් යටතේ ලක්ෂ්‍යාකාර වස්තුවක සහ දෘඪ වස්තුවක සමතුලිතතාව විස්තර කරයි.
			• බල තුනක් යටතේ ලක්ෂ්‍යාකාර වස්තුවක සමතුලිතතාව සඳහා අවශ්‍යතා ඉදිරිපත් කරයි.
			• ආනත බල තුනක් යටතේ දෘඪ වස්තුවක සමතුලිතතාව සඳහා අවශ්‍යතා ඉදිරිපත් කරයි.
			• සමාන්තර බල තුනක් යටතේ දෘඪ වස්තුවක සමතුලිතතාව සඳහා අවශ්‍යතා ඉදිරිපත් කරයි.
			• ඝූර්ණ මූලධර්මය ඉදිරිපත් කරයි.
			• එකිනෙකට ලම්බක බල දෙකක් සහිත බල තුනක ඒකතල බල පද්ධතියක් සඳහා වන ගැටලු විසඳයි.
				11

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව

6. කාර්යය, ශක්තිය සහ ජවය (ක්ෂමතාව) පිළිබඳ දැනුම ප්‍රායෝගික අවශ්‍යතා සඳහා උචිත ලෙස යොදා ගනියි.	6.1 කාර්යය, ශක්තිය සහ ජවය (ක්ෂමතාව) පිළිබඳ දැනුම ප්‍රායෝගික අවශ්‍යතා සඳහා උචිත ලෙස යොදා ගනියි.	• කාර්යය
		• යාන්ත්‍රික ශක්තිය
		  • චාලක ශක්තිය
		    • උත්තාරණ චාලක ශක්තිය
		  • විභව ශක්තිය
		    • ගුරුත්වාකර්ෂණ විභව ශක්තිය
		• ක්ෂමතාව (ජවය)
		• යාන්ත්‍රික ශක්ති සංස්ථිති මූලධර්මය
		• කාර්යක්ෂමතාව
			• කාර්යය, ශක්තිය හඳුන්වයි.
			• යාන්ත්‍රික ශක්තියේ ප්‍රභේද නම් කරයි.
			• උත්තාරණ චාලක ශක්තිය සඳහා ප්‍රකාශනය ඉදිරිපත් කරයි.
			• ගුරුත්වාකර්ෂණ විභව ශක්තිය සඳහා ප්‍රකාශනය ලබා ගනියි.
			• යාන්ත්‍රික ශක්ති සංස්ථිති මූලධර්මය ඉදිරිපත් කරයි.
			• ක්ෂමතාව අර්ථ දක්වයි.
			• යන්ත්‍රයට සපයන ජවය හා යන්ත්‍රයෙන් ලබා දෙන ඵලදායී ජවය මගින් කාර්යක්ෂමතාව හඳුන්වයි.
			• ක්ෂමතාව සහ කාර්යක්ෂමතාව ආශ්‍රිත ගැටලු විසඳයි.
				14

7. එදිනෙදා ජීවිතයේ කාර්යය ත්‍රිකෝණමිතික අනුපාත භාවිතයෙන් පහසු කර ගනියි.	7.1 ත්‍රිකෝණමිතික අනුපාත විස්තර කරයි.	• කෝණ මිනුම් වන අංශක හා රේඩියන හැඳින්වීම • රේඩියන සහ අංශක අතර සම්බන්ධතාව • සයිනය, කෝසයිනය හා ටැංජනය යන ත්‍රිකෝණමිතික අනුපාත හැඳින්වීම (දෙ වන වෘත්ත පාදය දක්වා) • $0, \frac{\pi}{6}, \frac{\pi}{4}, \frac{\pi}{3}, \frac{\pi}{2}$ කෝණවල ත්‍රිකෝණමිතික අනුපාත (sin, cos, tan) ² $\sin^2\theta + \cos^2\theta = 1$	• කෝණ මිනුම් ලෙස අංශක සහ රේඩියනය හඳුනා ගනියි. • රේඩියන සහ අංශක අතර සම්බන්ධතාව විස්තර කරයි. • සයිනය, කෝසයිනය, ටැංජනය යන ත්‍රිකෝණමිතික අනුපාත හඳුන්වයි. (දෙ වන වෘත්ත පාදය දක්වා) • $0, \frac{\pi}{6}, \frac{\pi}{4}, \frac{\pi}{3}, \frac{\pi}{2}$ කෝණවල ත්‍රිකෝණමිතික අනුපාතයන් සොයයි. • $\sin^2\theta + \cos^2\theta = 1$ සර්වසාම්‍ය පිහිටවයි.	*06*

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව
	7.2 ත්‍රිකෝණමිතික අනුපාත භාවිත කරයි.	• ත්‍රිකෝණමිතික අනුපාත භාවිතයෙන් ත්‍රිකෝණයක පාද සහ කෝණ සෙවීම. • ආරෝහණ කෝණ, අවරෝහණ කෝණ • $S=\frac{1}{2}ab\ \sin\ \mathrm{C}$ සූත්‍රය භාවිතයෙන් ත්‍රිකෝණයක වර්ගඵලය සෙවීම.	• ත්‍රිකෝණමිතික අනුපාත භාවිත කර ගැටලු විසඳයි. • සෘජුකෝණික ත්‍රිකෝණ ආශ්‍රිත දිග හා කෝණ සෙවීම සඳහා ත්‍රිකෝණමිතික අනුපාත භාවිත කරයි. (ප්‍රායෝගික අවස්ථා ද ඇතුළත් ව) • ප්‍රායෝගික අවස්ථාවල දී අරෝහණ කෝණ අවරෝහණ කෝණ ලැබෙන ආකාරය පිළිබඳ විමසිලිමත් වේ. • ත්‍රිකෝණයක සම්මත අංකනය භාවිතයෙන් ත්‍රිකෝණයක වර්ගඵලය සඳහා $S=\frac{1}{2}ab\ \sin\ \mathrm{C}$ සූත්‍රය ලබා ගන්නා ආකාරය විස්තර කරයි. • එම සූත්‍රය භාවිතයෙන් ත්‍රිකෝණයක වර්ගඵලය සොයයි. (ප්‍රායෝගික අවස්ථා ද ඇතුළත් ව)	09
	7.3 චාපයක දිග හා කේන්ද්‍රික ඛණ්ඩයක වර්ගඵලය සොයයි.	• චාපයක දිග • කේන්ද්‍රික ඛණ්ඩයක වර්ගඵලය	• චාපයක දිග සෙවීම සඳහා $l=r\theta$ සූත්‍රය හඳුනා ගනියි. • $l=r\theta$ සූත්‍රය භාවිතයෙන් චාපයක දිග ගණනය කරයි. • කේන්ද්‍රික ඛණ්ඩයක වර්ගඵලය පහත සඳහන් සූත්‍ර ඇසුරින් ගණනය කරයි. $\mathrm{S}=\frac{1}{2}r^2\theta$ (θ_1, රේඩියන්වලින් මැන ඇත.) $\mathrm{S}=\frac{2\theta}{2\pi}A$ (θ_1, රේඩියන්වලින් මැන ඇත. මෙහි A යනු කේන්ද්‍රික ඛණ්ඩය ලබා ගත් වෘත්තයේ වර්ගඵලයයි. $\mathrm{S}=\frac{\alpha^0}{360^0}A$ (α_1 අංශකවලින් මැන ඇති කේන්ද්‍රයේ ආපාතිත කෝණයයි.) • සංයුක්ත තල රූප ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා ඉහත සූත්‍ර භාවිත කරයි.	09

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව
8. භ්‍රමණ චලිත පිළිබඳ දැනුම ප්‍රායෝගික අවශ්‍යතා සඳහා යොදා ගනියි.	8.1 භ්‍රමණ චලිතය හා සම්බන්ධ දැනුම ප්‍රායෝගික අවශ්‍යතා සඳහා යොදා ගනියි.	• භ්‍රමණ චලිතය හා සම්බන්ධ භෞතික රාශි • f l dKls úi ,dmk h θ • කෝණික ප්‍රවේගය ω • ආවර්ත කාලය T • භ්‍රමණ සංඛ්‍යාතය f • අවස්ථිති ඝූර්ණය I • කෝණික ත්වරණය α • භ්‍රමණ චාලක ශක්තිය • ව්‍යාවර්තය τ • භ්‍රමණ චලිතයේ රාශීන් අතර සම්බන්ධතා • $\omega = 2\pi f$ • $\tau = I\alpha$ • $E = 1/2\, I\omega^2$	• භ්‍රමණ චලිතයේ යෙදෙන වස්තු සහ පද්ධති හඳුනා ගනියි. • භ්‍රමණ චලිතය හා සබැඳි භෞතික රාශි අතර සම්බන්ධතා සමීකරණයක් මගින් දක්වයි. • වස්තුවක භ්‍රමණ අවස්ථිතිය පිළිබඳ මිනුම ලෙස අවස්ථිති ඝූර්ණය හඳුන්වා දෙයි. • නිශ්චල ව පවතින වස්තුවකට භ්‍රමණයක් ලබා දීම සඳහාත් භ්‍රමණය වන වස්තුවක කෝණික ප්‍රවේගය වෙනස් කිරීම සඳහාත් ව්‍යාවර්තයක් යෙදිය යුතු බව පැහැදිලි කරයි. • භ්‍රමණ චලිතය හා සම්බන්ධ චලිත සමීකරණ භාවිතයෙන් සරල ගැටලු විසඳයි. • අවස්ථිති ඝූර්ණය දී ඇති වස්තු සඳහා ත්වරණය හා භ්‍රමණ චාලක ශක්තිය ආශ්‍රිත සරල ගැටලු විසඳයි.	24
9. විදුලි උපකරණ නඩත්තු කිරීම සහ පරිපථ සැලසුම් කිරීම සඳහා විද්‍යුතය පිළිබඳ දැනුම යොදා ගනියි.	9.1 ධාරා විද්‍යුතයේ මූලික සංකල්ප සහ මූලධර්ම පිළිබඳ අන්වේෂණයේ යෙදෙයි.	• විද්‍යුතය • විද්‍යුත් ආරෝපණ, විද්‍යුත් ධාරාව සහ විභව අන්තරය. • විද්‍යුත් ප්‍රතිරෝධය • සන්නායකයක ප්‍රතිරෝධය • ඕම් නියමය • ප්‍රතිරෝධය කෙරෙහි බලපාන සාධක • ප්‍රතිරෝධකතාව • උෂ්ණත්වය සමග ප්‍රතිරෝධය විචලනය • විද්‍යුත් ප්‍රභව • විද්‍යුත් ගාමක බලය • අභ්‍යන්තර ප්‍රතිරෝධය	• ධාරාව සහ ආරෝපණ අතර සම්බන්ධතාව දක්වයි. • විභව අන්තරය පැහැදිලි කරයි. • සන්නායකයක ප්‍රතිරෝධය සහ ද්‍රව්‍යයක ප්‍රතිරෝධකතාව පැහැදිලි කරයි. • උෂ්ණත්වය සමඟ ප්‍රතිරෝධයේ විචලනය ආදර්ශනය කර දක්වයි. • සුපිරි සන්නායකතාව හඳුන්වයි. • ප්‍රභවයක විද්‍යුත්ගාමක බලය සහ අභ්‍යන්තර ප්‍රතිරෝධය පැහැදිලි කරයි. • විද්‍යුත්ගාමක බලය, විභව අන්තරය, අභ්‍යන්තර ප්‍රතිරෝධය සහ විද්‍යුත් ධාරාව අතර සම්බන්ධතාව දක්වයි.	12

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව
		• ශ්‍රේණිගත සහ සමාන්තරගත ප්‍රතිරෝධ සංයුක්ත • විද්‍යුත් පරිපථ • කර්චොෆ් නියම I සහ II • කෝෂ සහ ප්‍රතිරෝධක සහිත පරිපථ • විද්‍යුත් උපකරණයක විද්‍යුත් ශක්තිය ක්ෂමතාව. • විද්‍යුතයේ තාපන ඵලය • සුපිරි සන්නායකතාව	• ශ්‍රේණිගත සහ සමාන්තරගත සරල පරිපථවල සමක ප්‍රතිරෝධය සොයයි. • ශ්‍රේණිගත ප්‍රතිරෝධක පද්ධතියක් විභව බෙදුමක් ලෙස භාවිත කළ හැකි බව ප්‍රකාශ කරයි. • ප්‍රතිරෝධ සංයුක්ත සහිත ද්විමාන සරල පරිපථ සඳහා ගණනයන් සිදු කරයි. • පරිපථ ආශ්‍රිත සරල ගණනයන් සඳහා ක'ර්චොෆ් නියම භාවිත කරයි. • ප්‍රතිරෝධකයක ජනනය වන තාප ප්‍රමාණය සෙවීම සඳහා ධාරාව, විභව අන්තරය සහ ප්‍රතිරෝධය සම්බන්ධ කර ගනී. • විද්‍යුත් උපකරණයක ක්ෂමතාව ආශ්‍රිත ගණනයන් සිදු කරයි.	
	9.2 විද්‍යුතය හා චුම්බකත්වය අතර අන්තර්ක්‍රියා පිළිබඳ අන්වේෂණයේ යෙදෙයි.	• විද්‍යුතය හා චුම්බකත්වය අතර අන්තර්ක්‍රියා • විද්‍යුත් ධාරාවේ චුම්බක ඵලය • චුම්බක ක්ෂේත්‍රයකට ලම්බක ව තබා ඇති ධාරාව ගෙන යන සන්නායකයක් මත බලය ($F = BIl$) • විද්‍යුත් චුම්බක ප්‍රේරණය • පරිණාමක • දඟරවල පොට සංඛ්‍යාව සහ විභව අන්තර අතර අනුපාතය $\frac{N_p}{N_s} = \frac{V_p}{V_s}$ • පරිපූර්ණ පරිණාමක සඳහා $V_p I_p = V_s I_s$	• පරිවරණය කරන ලද (පරිවෘත) කම්බි දඟරයක ගලන ධාරාව නිසා ඇති වන විද්‍යුත් චුම්බකත්වය ආදර්ශනය කරයි. • චුම්බක ක්ෂේත්‍රයක තබා ඇති ධාරාව ගලන සන්නායකයක් මත බල ආදර්ශනය කිරීමට ධාරා තුලාව යොදා ගනියි. • චුම්බක ක්ෂේත්‍රයකට ලම්බක ව තබා ඇති ධාරාව ගලන සන්නායකයක් මත බලයේ දිශාව සෙවීම සඳහා ෆ්ලෙමින්ගේ වමත් නියමය භාවිත කරයි. • චුම්බක බලයේ විශාලත්වය කෙරෙහි බලපාන සාධක නම් කරයි. • චුම්බක ක්ෂේත්‍රයකට ලම්බක ව තබා ඇති ධාරාව ගලන සන්නායකයක් මත බලය ගණනය කරයි.	*15*

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව
			• චුම්බක ක්ෂේත්‍රයක තබා ඇති ධාරාව ගෙන යන සෘජුකෝණාස්‍ර කම්බි දඟරයක් මත බල යුග්මයක් ඇති වන බව පිළිගනී. • සරල ක්‍රියාකාරකම් ඇසුරින් විද්‍යුත් චුම්බක ප්‍රේරණය විස්තර කරයි. • විද්‍යුත් චුම්බක ප්‍රේරණයේ යෙදීම් ලෙස ඩයිනමෝව හා පරිණාමක හඳුන්වා දෙයි. • අවකර හා අධිකර පරිණාමකවල උපයෝගීතාව උදාහරණ ඇසුරින් පැහැදිලි කරයි. • පරිණාමක හා සම්බන්ධ සරල ගණනයන් $V_p I_p = V_s I_s$ සූත්‍රය හා $\frac{N_p}{N_s} = \frac{V_p}{V_s}$ සූත්‍රය ඇසුරින් සිදු කරයි.	

10. තාපය පිළිබඳ දැනුම එදිනෙදා කටයුතු සහ විද්‍යාත්මක කටයුතු සඳහා යොදා ගනියි.	10.1 ඝන සහ ද්‍රව ප්‍රසාරණය පිළිබඳ අන්වේෂණය කරයි.	• තාපය
		  • ප්‍රසාරණය
		    • ඝන ද්‍රව්‍යවල රේඛීය, වර්ගඵල සහ පරිමා ප්‍රසාරණය
		    • ද්‍රව ප්‍රසාරණය
			• ඝන ප්‍රසාරණය සඳහා ප්‍රසාරණතාව සහ උෂ්ණත්ව වෙනස අතර සම්බන්ධතා ඉදිරිපත් කරයි.
			• ඝන ප්‍රසාරණය ආශ්‍රිත ව ගැටලු විසඳයි.
			• සරල ක්‍රියාකාරකමක් මගින් ද්‍රව ප්‍රසාරණය ආදර්ශනය කරයි.
				07

	10.2 තාප හුවමාරුව සහ අවස්ථා විපර්යාස පිළිබඳ අන්වේෂණයේ යෙදෙයි.	• තාප හුවමාරුව • විශිෂ්ට තාප ධාරිතාව • අවස්ථා විපර්යාසය • විලයනයේ විශිෂ්ට ගුප්ත තාපය • වාෂ්පීකරණයේ විශිෂ්ට ගුප්ත තාපය	• තාපජ ප්‍රසාරණයේ යෙදීම් විස්තර කරයි. • තාප ධාරිතාව අර්ථ දක්වා $Q = C\theta$ බව ප්‍රකාශ කරයි. • වි. තා .ධා අර්ථ දක්වා $Q = C\theta$ සමීකරණය ගොඩ නගයි.	07

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව
			• තාප හුවමාරුව විස්තර කර ඊට අදාළ සරල ගණනය කිරීම් සිදු කරයි. • දී ඇති ද්‍රව්‍යයක වි. තා .ධා සෙවීම සඳහා මිශ්‍රණ ක්‍රමය භාවිත කරයි. • ගුප්ත තාප අවස්ථා උෂ්ණත්ව කාල ප්‍රස්තාරයක සලකුණු කරයි. • විලයනයේ වි.ගු.තා අර්ථ දක්වයි. • වාෂ්පීකරණයේ වි.ගු.තා අර්ථ දක්වයි. • අවස්ථා විපර්යාසයක දී ලබා ගන්නා හෝ පිට කරන තාපය ප්‍රමාණනය කරයි.	
	10.3 තාප සංක්‍රාමණ ක්‍රම පිළිබඳ අන්වේෂණයේ යෙදෙයි.	• තාප සංක්‍රාමණ විධි • සන්නයනය • සංවහනය • විකිරණය	• තාප සංක්‍රාමණ විධි පිළිබඳ පැහැදිලි කරයි. • පරිවරණය කළ දණ්ඩක් හරහා තාප සන්නයන ශීඝ්‍රතාව කෙරෙහි බලපාන සාධක ප්‍රකාශ කරයි. • ප්‍රායෝගික ව තාප සන්නයන ශීඝ්‍රතාව අඩු කර ගත හැකි ආකාර යෝජනා කරයි. • උදාහරණ ඇසුරින් ස්වාභාවික සංවහන ක්‍රියාවලිය පැහැදිලි කරයි. • තාප විකිරණය කෙරෙහි පෘෂ්ඨ වර්ගඵලය, පෘෂ්ඨයේ ස්වභාවය හා උෂ්ණත්වය බලපාන බව උදාහරණ මගින් පෙන්වා දෙයි.	09

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව
11. තාප රසායනය හා සම්බන්ධ මූලික සංකල්ප ගවේෂණය කරයි.	11.1 භෞතික විපර්යාස හා සම්බන්ධ තාප විපර්යාස පරීක්ෂා කිරීමට තාප රසායනයේ මූලික සංකල්ප භාවිත කරයි.	• තාප රසායනය හා සම්බන්ධ මූලික සංකල්ප • තාපය, කාර්යය, ශක්තිය • පද්ධතිය, පරිසරය (වටපිටාව) හා මායිම • අවස්ථා විපර්යාස • විලීන වීම • මිදීම • ඌර්ධ්වපාතනය • ප්‍රතිඌර්ධ්වපාතනය • වාෂ්පීකරණය • සංඝනීභවනය	• තාපය, කාර්යය, ශක්තිය, පද්ධතිය, මායිම හා වටපිටාව යන පද අර්ථ දක්වයි. • මායිම හරහා පදාර්ථ හා ශක්ති හුවමාරු වන පද්ධතියක් විවෘත පද්ධතියක් ලෙස හඳුන්වයි. • මායිම හරහා ශක්තිය පමණක් හුවමාරු වන පද්ධතියක් සංවෘත පද්ධතියක් ලෙස හඳුන්වයි. • මායිම හරහා පදාර්ථය හා ශක්තිය හුවමාරු නො වන පද්ධතියක් ඒකලිත පද්ධතියක් ලෙස හඳුන්වයි. • පද්ධතියේ හා වටපිටාවේ එකතුව විශ්වය බව ප්‍රකාශ කරයි. • විලීන වීම, මිදීම, ඌර්ධ්වපාතනය, ප්‍රතිඌර්ධ්වපාතනය, වාෂ්පීකරණය, සංඝනීභවනය යන භෞතික විපර්යාස අර්ථ දක්වයි. • අවස්ථා විපර්යාස පිළිබඳ අණුක මට්ටමේ විග්‍රහයක යෙදෙයි.	*10*
	11.2 ප්‍රතික්‍රියා තාපය පරීක්ෂණාත්මක ව නිර්ණය කරයි.	• ප්‍රතික්‍රියා තාපය • තාපදායක හා තාපාවශෝෂක ප්‍රතික්‍රියා • ශක්ති පැතිකඩ • ප්‍රතික්‍රියා තාපයේ භාවිත	• ප්‍රතික්‍රියා තාපය යන්න විස්තර කරයි. • තාපදායක හා තපාවශෝෂක ප්‍රතික්‍රියා උදාහරණ ඇසුරින් පැහැදිලි කරයි. • තාපදායක හා තපාවශෝෂක ප්‍රතික්‍රියා ආදර්ශනය කරයි. • අම්ල-භස්ම ප්‍රතික්‍රියා ආශ්‍රිත, ප්‍රතික්‍රියා තාපය පරීක්ෂණ ඇසුරින් ගණනය කරයි. • ප්‍රතික්‍රියා ආශ්‍රිත තාප විපර්යාස ගණනය කිරීමේ දී සිදු කළ උපකල්පන ප්‍රකාශ කරයි. • ප්‍රතික්‍රියාවක් ආශ්‍රිත තාප විපර්යාසය ශක්ති රූපසටහනකින් නිරූපණය කරයි.	*07*

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව

12. චාලක රසායන විද්‍යාවේ මූලික සංකල්ප භාවිතයෙන් ප්‍රතික්‍රියා ශීඝ්‍රතාව පාලනය කරයි.	12.1 රසායනික ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාව කෙරෙහි බලපාන සාධක පරීක්ෂණාත්මක ව නිර්ණය කරයි.	• ප්‍රතික්‍රියා ශීඝ්‍රතාව
		• ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාව කෙරෙහි බලපාන සාධක
		  • උෂ්ණත්වය
		  • සාන්ද්‍රණය
		  • භෞතික ස්වභාවය (ප්‍රතික්‍රීයකවල පෘෂ්ඨීක වර්ගඵලය)
		  • උත්ප්‍රේරක
			• ප්‍රතික්‍රියා තාපයේ භාවිත උදාහරණ ඇසුරින් විස්තර කරයි.
			• ප්‍රතික්‍රියා තාපය පිළිබඳ හැදෑරීම් දෛනික ජීවිතයේ දී හා වැඩ ලෝකයේ දී ප්‍රයෝජනවත් වන බව පිළිගනියි.
			
			• යම් විපර්යාසයක ඒකක කාලයක් තුළ සිදු වන වෙනස් වීම ශීඝ්‍රතාව ලෙස ප්‍රකාශ කරයි.
			• ද්‍රව්‍ය ප්‍රමාණයේ වෙනස් වීම ප්‍රතික්‍රියා ශීඝ්‍රතාව මැනීමේ මූලික සාධකයක් ලෙස දක්වයි.
			• ශීඝ්‍රතාව සැසඳීමේ දී ද්‍රව්‍ය ප්‍රමාණය හෝ සාන්ද්‍රණය හෝ මත රඳා පවතින වෙනත් ගුණයක් භාවිත කළ හැකි බව පැහැදිලි කරයි.
			• ප්‍රතික්‍රියා ශීඝ්‍රතාව අධ්‍යයනය කරණු පිණිස කාලය මැනිය හැකි සෙමෙන් සිදු වන රසායනික ප්‍රතික්‍රියා තෝරා ගනියි.
			• ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාව කෙරෙහි බලපාන සාධක උෂ්ණත්වය, සාන්ද්‍රණය (පීඩනය), භෞතික ස්වභාවය (ප්‍රතික්‍රීයකවල පෘෂ්ඨීක වර්ගඵලය) හා උත්ප්‍රේරක නම් කරයි.
			• රසායනික ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාව කෙරෙහි උෂ්ණත්වයේ බලපෑම ආදර්ශනය කරයි.
			• ප්‍රතික්‍රියාවේ ශීඝ්‍රතාව කෙරෙහි සාන්ද්‍රණයේ බලපෑම පෙන්වීම සඳහා උදාහරණ සපයයි.
			• ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාව කෙරෙහි භෞතික ස්වභාවය බලපාන ආකාරය ආදර්ශනය කරයි.
			• සමජාතීය හා විෂමජාතීය උත්ප්‍රේරක මගින් ප්‍රතික්‍රියා ශීඝ්‍රතාව වෙනස් වීම ආදර්ශනය කරයි.
				10

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව

	12.2 රසායනික ප්‍රතික්‍රියාවක ශීඝ්‍රතාව කෙරෙහි බලපාන සාධක විස්තර කිරීමට චාලක රසායන විද්‍යාවේ මූලික සංකල්ප භාවිත කරයි.	• තනි පියවර ප්‍රතික්‍රියා
		• තනි පියවර ප්‍රතික්‍රියා සඳහා ශක්ති සටහන
		  • සක්‍රියන ශක්තිය
		• ප්‍රතික්‍රියාවක් සිදු වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා
		  • අණු ගැටීම
		  • උචිත දිශානතියක් සහිත ව ගැටීම
		  • සක්‍රියන ශක්තිය ඉක්මවා තිබීම
		• ඉහත අවශ්‍යතා සපුරා ලීමට උෂ්ණත්වය, සාන්ද්‍රණය, උත්ප්‍රේරක හා භෞතික ස්වභාවය බලපාන අන්දම
		• බහු පියවර ප්‍රතික්‍රියා
		• වේග නිර්ණ පියවර
			• තනි පියවර ප්‍රතික්‍රියාවක් යනු කුමක්දැයි විස්තර කරයි.
			• තනි පියවර ප්‍රතික්‍රියාවක් ආශ්‍රිත ව ප්‍රතික්‍රියා ඛණ්ඩාංකයට එදිරිව ශක්තිය ප්‍රස්තාරික ව ඉදිරිපත් කරයි.
			• සක්‍රියන ශක්තිය හඳුන්වයි.
			• ප්‍රතික්‍රියාවක් සිදු වීමට පසුරා ලිය යුතු අවශ්‍යතා නම් කරයි.
			• අණු ගැටීම, අණු උචිත දිශානතියකින් යුතු ව ගැටීම හා ගැටෙන අණු සක්‍රියන ශක්තිය ඉක්මවා තිබීම ප්‍රතික්‍රියාවක් සම්පූර්ණ වීමට සපුරාලිය යුතු අවශ්‍යතා බව ප්‍රකාශ කරයි.
			• ප්‍රතික්‍රියාවක් සිදු වීමට සපුරා ලිය යුතු අවශ්‍යතා තෘප්ත කිරීම කෙරෙහි උෂ්ණත්වය, සාන්ද්‍රණය, උත්ප්‍රේරක සහ භෞතික ස්වභාවය යන සාධක බලපාන ආකාරය විස්තර කරයි.
			• බහු පියවර ප්‍රතික්‍රියාවක් විස්තර කරයි.
			• ප්‍රතික්‍රියාවක වේග නිර්ණ පියවර පැහැදිලි කරයි.
				10

13. කාබනික සංයෝග ජෛවාණුවල ව්‍යුහය, වැදගත්කම හා භාවිත ගවේෂණය කරයි.	13.1 කාබනික සංයෝග සහ ජෛව පද්ධති සඳහා වැදගත් ක්‍රියාකාරී කාණ්ඩ හඳුනා ගනියි.	• කාබනික සංයෝග හැඳින්වීම
		• ජෛව රසායන විද්‍යාව සහ ජෛවාණු
		  • ජෛව රසායනික අණුවල ඇති ක්‍රියාකාරී කාණ්ඩ
		• ක්‍රියාකාරී කාණ්ඩවලට ආවේණික ලක්ෂණ
		  • විද්‍යුත් සෘණතාව
		  • ධ්‍රැවීය, නිර්ධ්‍රැවීය බව
		  • ජලයේ ද්‍රාව්‍යතාව සහ හයිඩ්‍රජන් බන්ධන
		  • ආම්ලිකතාව හෝ භාෂ්මිකතාව
			• කාබනික සංයෝග හඳුන්වයි.
			• ජෛව රසායන විද්‍යාව හා ජෛවාණු හඳුන්වයි.
			• කාබනික සංයෝග සහ ජෛව රසායනික අණු අතර ඇති සම්බන්ධතාව සාකච්ඡා කරයි.
			• ජෛව රසායනික අණුවල ඇති ක්‍රියාකාරී කාණ්ඩ වන -OH , $-NH_2$, -COOH , -CHO, -COR , හඳුනා ගනියි.
			• ක්‍රියාකාරී කාණ්ඩවල ආවේණික ලක්ෂණ ලැයිස්තු ගත කරයි.
				05

නිපුණතාව	නිපුණතා මට්ටම	විෂය අන්තර්ගතය	ඉගෙනුම් ඵල	කාලච්ඡේද සංඛ්‍යාව

	13.2 කාබෝහයිඩ්‍රේටවල ව්‍යුහය ගවේෂණය කරයි.	• කාබෝහයිඩ්‍රේට
		  • මොනොසැකරයිඩ
		  • ඩයිසැකරයිඩ
		  • පොලිසැකරයිඩ
		• කාබෝහයිඩ්‍රේටවල වැදගත්කම සහ භාවිත
		  • ජෛව පද්ධතිවල දී
		  • කර්මාන්තවල දී
			• කාබෝහයිඩ්‍රේට හඳුන්වා ඒවා මොනොසැකරයිඩ, ඩයිසැකරයිඩ හා පොලිසැකරයිඩ ලෙස වර්ග කරයි.
			• කාබෝහයිඩ්‍රේටයක අඩංගු සංඝටක මූලද්‍රව්‍ය හා විශේෂිත කාණ්ඩ නම් කරයි.
			• ඩයිසැකරයිඩවල හා පොලිසැකරයිඩවල අන්තර්ගත ග්ලයිකොසිඩික බන්ධන හඳුනා ගනියි.
